විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.


අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2012 දිනය / திகதி / Date 2012-05-24

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/ 2012**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>විශ්‍රාම වැටුප් අංක නිකුත් කිරීම</u>**

විශ්‍රාම වැටුප් අංක නිකුත් කිරීමේදී ලක්ෂ කාණ්ඩය තීරණය කරනු ලැබුවේ රාජ්‍ය පරිපාලන වැටුප් පරිවර්තන චක්‍රලේඛ වලට අනුරූපීවය. ඒ අනුව 2006- 04- 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/ 2006 අනුව මවිසින් 2006- 05- 23 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 5/ 2006 චක්‍රලේඛය මඟින් 11 ලක්ෂ කාණ්ඩ යටතේ විශ්‍රාම වැටුප් අංක නිකුත් කරන ලදී.

ඒ අනුව 2006- 01- 02 දින සිට සිවිල් හා අධිකරණ නිලධාරීන්ගේ විමධ්‍යගත වූ විශ්‍රාම ගැන්වීමේදී ("අ" ආකෘතිය) 1110001 න් ආරම්භ වී 1,199,999 දක්වා විශ්‍රාම වැටුප් අංක නිකුත් කිරීම මේ වන විට අවසන් වී ඇත. එබැවින් රාජ්‍ය පරිපාලන වැටුප් පරිවර්තනයක් පැමිණීමට පෙර 11 ලක්ෂ කාණ්ඩය යටතේ අංක ලබාදීම අවසන්වීම හේතුවෙන් 12 ලක්ෂ කාණ්ඩය යටතේ එනම් 1,200,000 සිට විශ්‍රාම වැටුප් අංක ලබාදීම 2012- 05- 15 දින සිට ක්‍රියාත්මක වන බව දැනුම් දෙමි.

2006- 01- 02 දින සිට සිවිල් හා අධිකරණ නිලධාරීන්ගේ විමධ්‍යගත නොකළ විශ්‍රාම ගැන්වීමේදී (පොදු 55 ආකෘතිය) 1,100,001 සිට ඉදිරියට ලබාදුන් අංක කාණ්ඩය තවදුරටත් එලෙසම ක්‍රියාත්මක වන බව කාරුණිකව දන්වා සිටිමි.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
4. විගණකාධිපති


| | Telephone | Fax |
|---|---|---|
| Director General | 2431647 | 2342078 |
| Director | 2432008 | 2342078 |
| Director (F) | 2434974 | 2391403 |
| Internal Auditor | 2329634 | 2329634 |

| | Telephone | Fax |
|---|---|---|
| W&OP | 2332346 | 2432214 |
| PSPF | 2324375 | 2332347 |
| L.G.U. | 2342525 | 2342525 |
| Registration | 2329178 | - |

| | Telephone |
|---|---|
| Policy | 2329580 |
| Forces | 2320439 |
| Computation | 2434414 |
| Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk